# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,414 - 2024 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා - 2024.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස : ඉඩම්

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක්


| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :** | |
| ප්‍රාරම්භක දැන්වීම් … … … … | — |
| අවසාන නියෝග … … … … | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් … … | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත … … … … | — |
| මධ්‍යම පළාත … … … … | — |
| දකුණු පළාත … … … … | — |
| උතුරු පළාත … … … … | — |
| නැගෙනහිර පළාත … … … … | — |
| වයඹ පළාත … … … … | — |
| උතුරු මැද පළාත … … … … | — |
| ඌව පළාත … … … … | — |
| සබරගමුව පළාත … … … … | — |

| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත …. … … … | — |
| මධ්‍යම පළාත …. … … … | — |
| දකුණු පළාත …. … … … | — |
| උතුරු පළාත …. … … … | — |
| නැගෙනහිර පළාත …. … … … | — |
| වයඹ පළාත …. … … … | — |
| උතුරු මැද පළාත …. … … … | — |
| ඌව පළාත …. … … … | — |
| සබරගමුව පළාත …. … … … | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් …. … … | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ..… … | 450 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් …. … | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම…. … — | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් …. … | 456 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 දෙසැම්බර් මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 දෙසැම්බර් මස 13 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ලියනගේ උපුල් ජානක පෙරේරා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.03.06 දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/වල/4179 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන කරපාගල, යගිරල පදිංචි තෙන්නකෝන්ගේ සෝමවතී වෙත ප්‍රදානය කොට මතුගම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L. D. O. 109/70 යටතේ1998.12.22 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු පස්දුන් කෝරළේ 784 කරපාගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කරපාගල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. සි. 88 දරන කට්ටි කැඩීමේ පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම: ගම්කැලේ

| | | |
|---|---|---|
| *උතුරට* | - | කේ. ඒ. වලෝසිංඤෝගේ ඉඩම, |
| *නැගෙනහිරට* | - | හේවගේ සමන් කුමාරගේ ඉඩම, |
| *දකුණට* | - | උදාරිස් විමලසේනගේ ඉඩම, |
| *බස්නාහිරට* | - | බටතොඹ ගහ ඕවිට. |

එල්. යූ. ජානක පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
වලල්ලාවිට.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින.

12 - 06/01

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ලිහිණියා කුමාරගේ මධුෂ සංකල්ප වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1990.03.26 දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/10663 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන පාන්තිය පදිංචි දොඩන්ගොඩ හේවගේ චෙලින් වෙත ප්‍රදානය කොට මතුගම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 25/195 යටතේ 1991.12.06 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉද්දගොඩ පත්තුවේ, පාන්තිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පාන්තිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කළුතර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මූ. පි. ක. 2340 දරන පිඹුරේ අංක 12 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.097 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම: පිටකුඹුරුකන්ද මූකලාන.

| | | |
|---|---|---|
| *උතුරට* | - | මූ. පි. ක. 1270/2, |
| *නැගෙනහිරට* | - | මූ. පි. ක. 2340 හි ලොට් අංක 13, |
| *දකුණට* | - | පාර, |
| *බස්නාහිරට* | - | මූ. පි. ක. 2340 හි ලොට් අංක 11. |

එල්. කේ. මධුෂ සංකල්ප,
ප්‍රාදේශීය ලේකම්,
මතුගම.

2024 මැයි මස 10 වැනි දින.

12 - 06/02

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලේකම් එස්. ත්‍රිමාන්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1990.06.21 දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/11056 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන මහහීනටියන්ගල පදිංචි වේලාපුර කංකානම්ලාගේ වෝල්ටර් ටයිටස් කෝව්ස් වෙත ප්‍රදානය කොට කළුතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 8/382 යටතේ 1991.08.30 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකයෙකු වීමට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර තොටමුණ උතුර පත්තුවේ/කෝරලයේ 727 - ඒ මහ හීනටියන්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහ හීනටියන්ගල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කළුතර සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. ක. 2391 දරන රේඛා සටහනේ අංක 14 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්. 0.057 විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම හිත්තඩිකන්ද, කැලේ *හෙවත්* මහප්පනවත්ත කැලේ යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය -

| | | |
|---|---|---|
| *උතුරට* | - | මු. පි. ක. 2391 හි ලොට් 16, |
| *නැගෙනහිරට* | - | මු. පි. ක. 2391 හි ලොට් 15, |
| *දකුණට* | - | මු. පි. ක. 2391 හි ලොට් 20, |
| *බස්නාහිරට* | - | මු. පි. ක. 2391 හි ලොට් 13. |

එස්. ත්‍රිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2024 අප්‍රේල් මස 01 වැනි දින.

12 - 06/03

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කේ. ටී. සාරංගී ධීරරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1995.03.10 දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/කළු/789 අංක දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කාරුණාමුනි දයාරත්න සිල්වා වෙත ප්‍රදානය කොට පානදුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 23/87 යටතේ 1995.05.12 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර තොටමුණ උතුර පත්තුවේ/කෝරලයේ 709 ඩී අරියගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙල්දුව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද අංක මු. පි. ක. 2842 දරන රේඛා සටහනේ අංක 101 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්. 0.0383 විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම

| | | |
|---|---|---|
| *උතුරට* | - | 93 වැනි කැබැල්ල, |
| *නැගෙනහිරට* | - | 102 හා 113 වැනි කැබලි, |
| *දකුණට* | - | 113, 114 හා 115 වැනි කැබලි, |
| *බස්නාහිරට* | - | 115 හා 100 වැනි කැබලි. |

කේ. ටී. සාරංගි ධීරරත්න,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2024 ජූලි මස 25 වැනි දින.

12 - 06/04

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එස්. ත්‍රිමාන්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1984.06.12 දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/2894 අංක දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන ජාවත්ත වත්ත පදිංචි රඹුක්කනගේ ලිලිනෝනා වෙත ප්‍රදානය කොට කළුතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 8/14 යටතේ 1988.03.25 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර තොටමුණ උතුර පත්තුවේ, 718 ඒ - ජාවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, එතතමඩල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කළුතර සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. ක. 542 දරන රේඛා සටහනේ අංක 223 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් 34 විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම ජාවත්තවත්ත

| | | |
|---|---|---|
| *උතුරට* | - | මු. පි. ක. 542 ලොට් අංක 224, |
| *නැගෙනහිරට* | - | මු. පි. ක. 542 ලොට් අංක 268 (258), |
| *දකුණට* | - | මු. පි. ක. 542 ලොට් අංක 221 (පාර), |
| *බස්නාහිරට* | - | මු. පි. ක. 542 ලොට් අංක 222. |

එස්. ත්‍රිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2024 අප්‍රේල් මස 01 වැනි දින.

12 - 06/05

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ලිහිණියා කුමාරගේ මධුෂ සංකල්ප වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1999.06.08 දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/මතු/2187 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන ආදාවල, මීගම, දර්ගා නගරය පදිංචි මැස්ටියගේ බෙබී ගුණතිලක වෙත ප්‍රදානය කොට මතුගම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 120/153 යටතේ 1999.10.19 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉද්දගොඩ පත්තුවේ, ආදාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ආදාවල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කළුතර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පී. පී. ඒ. 818 දරන පිඹුරේ අංක 10 කොටසක් දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් පර්. 20 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම: ආදාවල ලන්ද

| | | |
|---|---|---|
| *උතුරට* | - | බන්දුමති හෙට්ටි ආරච්චිගේ බලපත්‍ර ඉඩම, |
| *නැගෙනහිරට* | - | දළුවත්තගේ සුමනසිරිගේ ඉඩම සහ කේ. කේ. ජේදුක්ගේ බලපත්‍ර ඉඩම , |
| *දකුණට* | - | ප්‍රවේශ මාර්ගය, |
| *බස්නාහිරට* | - | ප්‍රවේශ මාර්ගය සහ බන්දුමති හෙට්ටි ආරච්චිගේ බලපත්‍ර ඉඩම. |

එල්. කේ. මධුෂ සංකල්ප,
ප්‍රාදේශීය ලේකම්,
මතුගම.

2024 මාර්තු මස 19 වැනි දින.

12 - 06/06

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය.

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එම්. රංජන් පී. පෙරේරා වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.12.31 දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/5592 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මුලටියන පයාගල පදිංචි තාප්පුවාචාරි එදුරුතිලක අර්නොලිස් රාජදාස වෙත ප්‍රදානය කොට කළුතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ./10/46 යටතේ 1993.02.03 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර තොටමුණ දකුණ පත්තුවේ/ කෝරළේ 733 මලේගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පඬේ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක පී. පී. එන්. 3978 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 288 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 35 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මුලටියන

| | | |
|---|---|---|
| උතුරට | - | පී. පී. එස්. 3978 ලොට් 279, 278, |
| නැගෙනහිරට | - | පී. පී. එස්. 3978 ලොට් 289, 296, |
| දකුණට | - | පී. පී. එස්. 3978 ලොට් 296 සහ 280 (පාර රක්ෂිතය) |
| බස්නාහිරට | - | පී. පී. එස්. 3978 ලොට් 280 (පාර රක්ෂිතය). |

එම්. රංජන් පී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2024 ජූලි මස 19 වැනි දින.

12 - 06/07

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය.

දකුණු පළාතේ, පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කුසලක නානායක්කාර වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.12.12 දින ප්‍රදානය කර ඇති අංක මාර/10/ප්‍ර/26688 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වැලිමඩුව, කහගල, කඹුරුපිටිය පදිංචි කිරාහන්දි මනිමෙල් ද සිල්වා වෙත ප්‍රදානය කොට මාතර ඉඩම් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 1329 යටතේ 1996.03.12 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගහබඩ පත්තුවේ කහගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කහගල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක මාර/90/151/බී දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක ඒ. ටී. දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.071 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මාස්මුල්ල කැලේ

| | | |
|---|---|---|
| උතුරට | - | ප්‍රධාන මාර්ගය සහ ඒ. එස්. කැබැල්ල, |
| නැගෙනහිරට | - | ඒ එස් සහ ඉඩමේ පිවිසුම් මාර්ගය, |
| දකුණට | - | ඒ කිව් කැබැල්ල, |
| බස්නාහිරට | - | ඒ කිව් සහ ඒ යූ කැබැල්ල. |

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2023 නොවැම්බර් මස 15 වැනි දින.

12 - 07/01

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 (අ) උපවගන්තිය) සඳහා වූ නිවේදනය.

දකුණු පළාතේ, පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කාංචනා කේ. තල්පාවිල වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.07.30 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/7877 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පෝරඹ කනංකෙ පදිංචි මොරවක හේවගේ විලියම් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 1254 D 7/21 යටතේ 1986.08.13 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකුවීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 (අ) උපවගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ, පොරඹ කනංකෙ දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පෝරඹ කනංකෙ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද අ. ග. පි. 559 හි කැබලි අංක 437 ඒවී, ප්‍රමාණයෙන් රූඩ් 03 පර්. 39 ක විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද ඇටඹගලවිලහේන රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| උතුරට | - | අ. ග. පි. 559 හි 437 ඒ ආර් කැබැල්ල, |
| නැගෙනහිරට | - | අ. ග. පි. 559 හි 437 ඒ ඩබ්ලිව් කැබැල්ල, |
| දකුණට | - | අ. ග. පි. 559 හි 437 බී ඒ කැබැල්ල, |
| බස්නාහිරට | - | අ. ග. පි. 559 හි 437 ඒ යූ කැබලි |

කාංචනා කේ. තල්පාවිල,
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

2024 මැයි මස 15 වැනි දින.

12 - 07/02

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය.

දකුණු පළාතේ, පළාත් සභාවේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) වින්ධ්‍යා ඩී. සමරක්කොඩි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.02.25 දින ප්‍රදානය කර ඇති අංක මාර/ප්‍ර/10016 දරන ප්‍රදාන පත්‍රයෙහි හිමිකරු වන පරපාමුල්ල පදිංචි මුණසිංහ ආරච්චිගේ බබාහාමි වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO-2053 යටතේ 1986.10.27 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකුවීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කන්දබඩ පත්තුව බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, කන්දබඩ පත්තුවේ, පරපාමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පරපාමුල්ල නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 21 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. පි. 90 දරන පිඹුරෙහි අංක 698 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.309 ක් ඇතැයි ගණන් බලා තිබෙන ගල්ගොඩේහේන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම කට්ටිය:-

| | | |
|---|---|---|
| උතුරට | - | අ. ග. පි. 90 හි අංක 695 කැබැල්ල, |
| නැගෙනහිරට | - | ප්‍රවේශ මාර්ගය, |
| දකුණට | - | අ. ග. පි. 90 හි අංක 76, 101 ඩී, 187ඒ කැබලි, |
| බස්නාහිරට | - | අ. ග. පි. 90 හි අංක 697 1/2 |

වින්ධ්‍යා ඩී. සමරක්කොඩි,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2024 පෙබරවාරි මස 19 වැනි දින.

12 - 07/03

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

දකුණු පළාත් සභාවේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) වින්ධ්‍යා ඩී. සමරක්කොඩි වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.04.28 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/6640 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පරපාමුල්ල පදිංචි විජේතුංග කුලප්පු ආරච්චිගේ සෝමදාස වෙත ප්‍රදානය කොට මාතර ඉඩම් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 1063 යටතේ 1985.12.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කන්දබඩ පත්තුව බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, කන්දබඩ පත්තුවේ, පරපාමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පරපාමුල්ල නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 14 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. පි. 90 දරන පිඹුරෙහි අංක 327 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 35 ක් ඇතැයි ගණන් බලා තිබෙන අලුපොතේහේන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය:-

| | | |
|---|---|---|
| උතුරට | - | අ. ග. පි. 90 හි අංක 83 කැබැල්ල, |
| නැගෙනහිරට | - | අ. ග. පි. 90 හි අංක 328 කැබැල්ල, |
| දකුණට | - | අ. ග. පි. 90 හි අංක 326 කැබැල්ල, |
| බස්නාහිරට | - | අ. ග. පි. 90 හි අංක 324 කැබැල්ල. |

වින්ධ්‍යා ඩී. සමරක්කොඩි,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2024 පෙබරවාරි මස 19 වැනි දින.

12 - 07/04

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එස්. කේ. ජී. ප්‍රසංගිකා වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.07.30 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර 7288 ප්‍රදාන පත්‍රයෙහි හිමිකරු වන බානගල පදිංචි හේවා නැකතිගේ සාදිරිස් වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 167 යටතේ 1986.08.07 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ දකුණ බානගල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බානගල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, මාතර මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අ. ග. පි. 26 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 537 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් අක්කර 01 පර්චස් 16 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, ඇතුන්කැවිලහේන නමැති රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| උතුරට | - | අ. ග. පි. 26 හි 590 කැබැල්ල, |
| නැගෙනහිරට | - | අ. ග. පි. 26 හි 569 කැබැල්ල, |
| දකුණට | - | අ. ග. පි. 26 හි 539 කැබැල්ල, |
| බස්නාහිරට | - | අ. ග. පි. 26 හි 538 කැබැල්ල. |

එස්. කේ. ජී. ප්‍රසංගිකා,
ප්‍රාදේශීය ලේකම්,
පිටබැද්දර.

2024 අප්‍රේල් මස 30 වැනි දින.

12 - 07/05

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/73439.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්පී/28/04/02/01/1297

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

වවුනියාව දිස්ත්‍රික්කයේ, වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පිරමනාලංකුලම් 207 D, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිරමනාලංකුලම් ගමේ ප්‍රමාණයෙන් අක්කර 05 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා තිල්ලෙයම්පලම් ක්‍රිෂ්ණදාස් මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ.

*උතුරට* : පෙරියතම්පංන් - මඩු පාර,
*නැගෙනහිරට* : පටුමග,
*දකුණට* : රජයේ ඉඩම,
*බටහිරට* : රජයේ ඉඩම.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* : අවුරුදු තිහයි (30) (2024.08.01—2054.07.31 දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල* : 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2024 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000.00) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2024.08.01 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 නොවැම්බර් මස 06 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, “මිහිකත මැදුර”,
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12 - 44

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/62086.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : ALC/KG/D/2/1/3/105.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 62 අරුග්ගම්මන ග්‍රාම නිලධාරී වසමේ, පහලගම ගමේ පිඹුරු අංක මු. පි. කෑ 3061 හි කැබලි අංක 29 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4760 ක් වූ රජයේ ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා බෝධිමළුව ආරාමයේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙ හි මායිම් :

*උතුරට* : කැබලි අංක 28, 26 සහ 05,
*නැගෙනහිරට* : කැබලි අංක 05 සහ 34,

*දකුණට* : කැබලි අංක 34 සහ 35 ,
*බටහිරට* : කැබලි අංක 35, 28 සහ මනුවෙමුල්ල හේන

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍යා කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* : අවුරුදු තිහයි (30) (2024.08.07 දින සිට 2054.08.06 දින දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල* : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2024 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම ආගමික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුලත දී පළාත් ඉඩම් කොමසාරිස් / ප්‍රාදේශීය ලේකම් ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස් / ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2024.08.07 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*(ඒ)* දිසාපතිගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව කිසිදු අයුරකින් මෙම ඉඩමේ තිබෙන ගස්කොළවලට කිසිදු හානියක් නොකළ යුතුය.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම් සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 නොවැම්බර් මස 20 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12 - 80

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/77195.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NWP/PLC/L9/MH/LTL/22.

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 197, විලව ග්‍රාම නිලධාරී වසමේ විලව ගමේ, අ. ග. පි. 1981 හි කැබලි අංක 428 න් කොටසක් පෙන්වීම සඳහා බලයලත් මිනින්දෝරු ඒ. එම්. එල්. කෝලිත බණ්ඩාර මහතා විසින් මැන සකසන ලද අංක 2024/SP/01 දරන පිඹුරේ කැබලි අංක 01 මඟින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 6.0704 පමණ වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා AMARA GREEN ENERGY (PVT) LTD විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙ හි මායිම් මෙහි පහත සඳහන් වේ.

*උතුරට* : අ.ග.පි. 1981 පිඹුරේ කැබලි අංක 526, කැබලි අංක 431 සහ කැබලි අංක 428 හි කොටසක්,
*නැගෙනහිරට* : අ. ග. පි. 1981 පිඹුරේ කැබලි අංක 428හි ඉතිරි කොටස,
*දකුණට* : අ. ග. පි. 1981 පිඹුරේ කැබලි අංක 428 හි ඉතිරි කොටස, ප්‍රවේශ මාර්ගය හා කුඹුක්වැව ගම්මායිම ,
*බටහිරට* : අ. ග. පි. 2992 කුඹුක්වැව ගම්මායිම, ප්‍රවේශ මාර්ගය, අ. ග. පි. 1981 පිඹුරේ කැබලි අංක 526, කැබලි අංක 431

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍යා කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය* : අවුරුදු තිහයි (30) (2024.12.02 දින සිට 2054.12.01 දින දක්වා)

*(ආ) වාර්ෂික බදු මුදල* : 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස් / ප්‍රාදේශීය ලේකම් ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ)/ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2024.12.02 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*(ඒ)* බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 දෙසැම්බර් මස 04 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, “මිහිකත මැදුර”,
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12 - 150

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම් ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතු ය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **දෙසැම්බර්** | 2024.12.06 | සිකුරාදා | 2024.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.13 | සිකුරාදා | 2024.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.20 | සිකුරාදා | 2024.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.27 | සිකුරාදා | 2024.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2025 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2025.01.03 | සිකුරාදා | 2024.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.10 | සිකුරාදා | 2024.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.17 | සිකුරාදා | 2025.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.24 | සිකුරාදා | 2025.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.31 | සිකුරාදා | 2025.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2025.02.07 | සිකුරාදා | 2025.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.14 | සිකුරාදා | 2025.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.21 | සිකුරාදා | 2025.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.28 | සිකුරාදා | 2025.02.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.